ET/SS/2022(2023)/OL/87/S/A/S-1

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Communication and Media Studies

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය




## Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

# පත්‍රය I - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 11 | 4 | 21 | 3 | 31 | 3 |
| 02 | 4 | 12 | 4 | 22 | 2 | 32 | 2 |
| 03 | 3 | 13 | 4 | 23 | 2 | 33 | 1 |
| 04 | 1 | 14 | 3 | 24 | 4 | 34 | 1 |
| 05 | 1 | 15 | 1 | 25 | 1 | 35 | 4 |
| 06 | 2 | 16 | 4 | 26 | 2 | 36 | 1 |
| 07 | 1 | 17 | 2 | 27 | 3 | 37 | 3 |
| 08 | 4 | 18 | 2 | 28 | 2 | 38 | 3 |
| 09 | 3 | 19 | 4 | 29 | 3 | 39 | 2 |
| 10 | 2 | 20 | 4 | 30 | 2 | 40 | 1 |

විශේෂ උපදෙස් - එක් පිළිතුරකට ලකුණු 01 බැගින්

මුළු ලකුණු 1 X 40 = 40

## ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 | - | 20 |
| 2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරාගත් ප්‍රශ්න 04 ලකුණු 10 බැගින් | - | 40 |
| | | 60 |

## කොටස් ලකුණු බෙදීම

2 - 6 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

| | | | |
|---|---|---|---|
| I. | කොටසට | - | ලකුණු 1 |
| II. | කොටසට | - | ලකුණු 2 |
| III. | කොටසට | - | ලකුණු 3 |
| IV. | කොටසට | - | ලකුණු 4 |
| | | | 10 |

## පත්‍රය II - පිළිතුරු

01.

(i) සමූහ සන්නිවේදනය

(ii) සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධවන පුද්ගලයන් සංඛ්‍යාව මත සමූහ සන්නිවේදනය අර්ථ දැක්වේ.
සමූහය කුඩා හෝ විශාල විය හැකිය.
සන්නිවේදකයා ඉදිරියේ සිටින තැනැත්තන් සමඟ කෙරෙන සන්නිවේදනය සමූහ සන්නිවේදනයට අයත් වේ.
බොහෝ දුරට ඒක පාර්ශවීය සන්නිවේදනයකි.
ග්‍රාහක ක්ෂේත්‍රය විවිධාකාර වූ සාමාජිකයන්ගෙන් සමන්විත විය හැකිය.
අවශ්‍යතාව අනුව තාක්ෂණික උපකරණ භාවිත කළ හැකි වීම

(iii) ශාරීරික ඉඟි හා ඉරියව්
මුහුණේ ඉඟි හා ඉරියව්
ඇස්වල හැසිරීම
හඬ උච්චාරණය හා නිහඬ බව
ඇඳුම් පැළඳුම්

(iv) තොරතුරු සම්පාදනය
අධ්‍යාපනය
පෙළඹවීම
සමාජානුයෝජනය
විනෝදාස්වාද සම්පාදනය
සංවාද හා සාකච්ඡා
සංස්කෘතික ප්‍රගමනය

(v) සන්නිවේදකයා පැහැදිලිව හඳුනාගත හැකිවීම (විදුහල්පතිතුමා)
තොරතුරු මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත හැකිවීම
සංවිධානාත්මක බව
සන්නිවේදනය ඉහළ සිට පහළට ගලා යාම

(vi) මුද්‍රිත මාධ්‍ය
පුවත්පත්
අත්පත්‍රිකා
පෝස්ටර්
බැනර්

විද්‍යුත් මාධ්‍ය
රූපවාහිනිය
ගුවන්විදුලිය

(vii) අර්ථ බාධක
මාධ්‍ය බාධක

(viii) WhatsApp, Viber, Imo, Telegrame,

(ix) ක්ලෝඩ් ෂැනොන් සහ වොරන් වීවර්

(x) මාධ්‍ය අභිසාරීතාව

02.

(i) සිතිවිලි හා හැඟීම් මත සන්නිවේදනය සිදුවීම
තම දැක්මට අනුව සංකල්ප ක්‍රියාත්මක වීම
ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම
තමා තුළ පවතින මතකය අනුව සන්නිවේදනය සිදු වීම
තමාගේ අර්ථකථනයන්ට අනුව සන්නිවේදනයේ යෙදීම

(ii) ලිඛිත සන්නිවේදනය
ලිඛිත භාෂාවේ ව්‍යාකරණ තිබීම
අක්ෂර වින්‍යාසය තිබීම
අකුරුවල හැඩයක් තිබීම
විරාම ලක්ෂණ යෙදිය යුතු වීම
ලිවීමේ දී වචන ඇත්කර ලිවීම
ඡේද වෙන්කර දැක්වීම

(iii) නිරවුල් බව හා පැහැදිලි බව - ලේඛනයේ අන්තර්ගත අදහස නිශ්චිතවම දැක්විය යුතු වීම
ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව - එක් එක් ලේඛනයට යොදා ගන්නා සැළසුම් සඳහා අනන්‍යතාවක් යොදාගත යුතුය.
සම්මත ව්‍යාකරණ විධි භාවිතය - ලේඛනයේ දී නිවැරදිව යොදාගත යුතු ය.

(iv) විවිධ කරුණු යටතේ ලියවුණු ලිපි අධ්‍යයනය කිරීම
ලිපි ලිවීම
වාර්තා ලිවීම
පාසලේ ප්‍රධාන ප්‍රවෘත්ති පුවත්පත්වලට ලියා යැවීම
නිර්මාණාත්මක පිටපත් බෙදා හැරීම

**3.**

(i)

| | | |
|---|---|---|
| නාට්‍ය | නවකතා | තීරු ලිපි |
| ගීත | ප්‍රවෘත්ති | විශේෂාංග ලිපි |
| කාව්‍ය | දැන්වීම් | වාර්තා වැඩසටහන් |
| කෙටිකතා | | |

(ii)

| | |
|---|---|
| නැවුම් බව | අර්ථ සම්පන්න බව |
| සුවිශේෂී බව | සියුම් ලෙස සිතීමේ හැකියාව |
| සංවේදී බව | ගුණාත්මක සන්නිවේදනයක් සිදු වීම |
| ප්‍රයෝජනවත් බව | ඉහළ රුචිකත්වයක් ඇති වීම |

(iii) භාෂාත්මක ප්‍රකාශන විධි
ශ්‍රව්‍ය ප්‍රකාශන විධි
දෘශ්‍ය ප්‍රකාශන විධි
ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි

(iv) බොහෝ දේ ඇසින් දැකීමට හුරු වෙයි
රසඥතාව දියුණු වෙයි
සිරිත් විරිත් උගනියි
රසවිඳීමට උගනියි
අධ්‍යාපනය ප්‍රියජනක කරවයි
සංස්කෘතිය උගනියි

**4.**

(i) නිශ්චල ඡායාරූපයක් යනු දර්ශනයක එක් නිමේෂයක් සටහන් කර ගැනීමයි.

(ii) ඡායාරූප ශිල්පියා
කැමරාව
අරමුණු හෙවත් අපේක්ෂිත දර්ශනය
ආලෝකය

(iii) මානනය - අරමුණට අනුව ඡායාරූපයට හසුකරගන්නේ කුමක්ද යන්න තීරණය කිරීම. රූප රාමුවට ඇතුළත් වන්නේ මොනවා ද හා ඒ අනුව කැමරාව පිහිටුවා ගැනීම මෙහිදී සිදු වේ.
නාභිගත කිරීම - ඡායාරූපයට හසුකර ගත්නා අරමුණ වඩාත් පැහැදිලි වනසේ කාචය සීරු මාරු කිරීම.
අනාවරණය - කාච විවරයේ හා ද්වාරයේ පිහිටීම නිසි පරිදි සකස් කොට ආලෝකය පාලනය කිරීම සහ ප්‍රතිබිම්බය සටහන් කර ගැනීම

(iv) අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව
තාත්වික බව නිසා ග්‍රාහක විශ්වසනීයත්වය දිනාගත හැකිවීම
පහසුවෙන් ග්‍රාහක ආකර්ශනය ලබා ගත හැකිවීම
පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට ඇති හැකියාව
ඕනෑම කෙනෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව

**5.**

(i) පවුල් සංස්ථාව
ස්ත්‍රී පුරුෂ සමාජභාවය
වාර්ගිකත්වය
පුරවැසිභාවය
මානව හිමිකම් හා වගකීම්

(ii) ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත්වීම
ඡන්ද අයිතිය පාවිච්චි කිරීම
බදු ගෙවීම
නීති ගරුක වීම
සමාජ සුබ සාධනයට කටයුතු කිරීම
දේශාභිමානීව කටයුතු කිරීම
සියලු ආගම්වලට හා සියලු ජාතීන්ට ගරු කිරීම
යහපත් ලෙස වෘත්තියක නියැළීම
ආචාරශීලී වීම හා ගුණ ගරුක වීම
පවුල තුළ යහපත්ව ජීවත් වීම

(iii) වැඩලෝකයේ පවත්නා ස්වභාවය හා වෙනස්වීම් රටාව නිවැරදිව හා ප්‍රමාණාත්මකව සමාජගත වන පරිදි ප්‍රවෘත්ති හා විශේෂාංග ඉදිරිපත් කිරීම
වැඩ ලෝකය විසින් ඉල්ලනු ලබන පුද්ගල ගුණාංග පිළිබඳ සමාජය දැනුවත් කිමීම සඳහා විවිධ ආකෘති යටතේ මාධ්‍ය සන්දේශ ඉදිරිපත් කිරීම
වැඩ ලෝකය ජයගත් පුද්ගලයින් හා සංවිධාන පිළිබඳ නිර්මාණාත්මක වැඩසටහන් (නාට්‍ය, ගීත, සාකච්ඡා) ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කිරීම
රූපවාහිනී නාට්‍ය තුළින් විවිධ වැඩ ස්ථාන ඇසුරු කරමින් ඒ පිළිබඳ දැනුමක් හා හැඟීමක් ප්‍රේක්ෂයා තුළ ඇතිවන ආකාරයෙන් නිර්මාණ ඉදිරිපත් කිරීම
වැඩ ලෝකයේ නව ප්‍රවණතා පිළිබඳ සමාජය දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය ආකෘති ඔස්සේ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කිරීම

(iv) සදාචාර සම්පන්න හා සාරධර්මානුකූල රූපවාහිනී නාට්‍ය ඉදිරිපත් කිරීම
සදාචාර සම්පන්න හා සාරධර්මානුකූල නවකතා ඉදිරිපත් කිරීම
සංගීත වැඩසටහන් ඉදිරිපත් කිරීම (ගීතවල අන්තර්ගතය, ගීත ගායනා විලාසය, ඇඳුම් පැළඳුම්, හැසිරීම)
වෙළෙඳ දැන්වීම් මගින් යහපත් පාරිභෝගික චර්යා ඇති කිරීම

6.

(i) මහජන සේවාවක් ලෙස මාධ්‍ය පවත්වාගෙන යාම
වාණිජ පරමාර්ථයෙන් මාධ්‍ය පවත්වාගෙන යාම

(ii) තැපැල්පත්
දුරකථන ඇමතුම්
විද්‍යුත් තැපැල
කෙටි පණිවිඩ
සමාජ ජාල වෙබ් අඩවි
පුවත්පත්වලට ලිපි සම්පාදනය
ලිපියක් ලෙස සකසා ප්‍රතිචාර දන්වා යැවීම
මාධ්‍ය පාගමනක් හෝ උද්ඝෝෂණ සංවිධානය කිරීම

(iii) භූගෝලීය වශයෙන් සීමා නොවීම
ග්‍රාහකයාට අභිමත පරිදි සංදේශ තෝරා ගැනීමට හැකිවීම
පරිගණකය, ජංගම දුරකථනය වැනි බහුමාධ්‍ය උපකරණ ආශ්‍රිතව භාවිත කිරීමට හැකි වීම
ඕනෑම අවස්ථාවක, ඕනෑම ස්ථානයක සිට භාවිත කළ හැකි වීම
ගෝලීය වශයෙන් ව්‍යාප්තිය සිදුවීම
සම්බන්ධවන සියලු දෙනාටම අන්තර් ක්‍රියාකාරී ලෙස තොරතුරු හුවමාරු කරගැනීමට හා සංස්කරණය කිරීමට ඇති හැකියාව

(iv) අන් අය රැවටීම සඳහා භාවිත නොකිරීම
අන් අය කාර්ය බහුල, නිදන හෝ විවේක ගන්නා අවස්ථා වලදී ඔවුන්ට බාධාවන පරිදි භාවිත නොකිරීම
ඇමතුම් ලබා දෙන්නා හෝ ලබා ගන්නා වෙත ආචාරශීලීව කථා කිරීම
අන් අයට බාධාවන අයුරින් ශබ්ද නගා ජංගම දුරකථනයෙන් කතා නොකිරීම
සිනමා ශාලා, පුස්තකාල, රැස්වීම් වැනි පොදු ස්ථාන වලදී ජංගම දුරකථන ක්‍රියා විරහිත කර හෝ නිශ්ශබ්ද කර තැබීම
ජංගම දුරකථන ඔස්සේ පැමිණෙන නාඳුනන ඇමතුම් හෝ කෙටි පණිවිඩවලට අනවශ්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමෙන් වැළකීම
අන් අයගේ ජංගම දුරකථනවල ඇතුළත් තොරතුරු අනවසරයෙන් භාවිත කිරීමෙන් වැළකීම


7.

(i) රූපවාහිනී ප්‍රවෘත්ති
සමාජ ජාල වෙබ් අඩවි
ගුවන්විදුලි වැඩසටහන්
පුවත්පත් විශේෂාංග

(ii) ඍජු වාර්තාකරණය - යම් සිදුවීමක් ඒ සිදුවූ ආකාරයෙන්ම ඉදිරිපත් කිරීම මින් අදහස් කෙරේ.
නිර්මාණාත්මක වාර්තාකරණය - සිද්ධියක් ඉදිරිපත් කිරීමේ දී ඍජු වාර්තාකරණයෙන් මිදී ආකර්ෂණීය ආකාරයෙන් ඉදිරිපත් කිරීම නිර්මාණාත්මක වාර්තාකරණය යි.

(iii) පෞද්ගලිකත්වයට හානි කරන හෝ හෝ හෙළි කිරීමට අකමැති තොරතුරු ඉල්ලා නොසිටිය යුතුය.
තොරතුරු ලබා දෙන පුද්ගලයා හෙවත් දත්ත දායකයා වෙහෙසට පත් නොකළ යුතුය.
ලබාගන්නා තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කළ යුතුය.
අදාළ තොරතුරු පමණක් විමසිය යුතුය.
තොරතුරු රැස් කිරීමේ දී සත්‍ය තොරතුරු මිස තම මතය සනාථ වන තොරතුරු රැස් නොකළ යුතුය.
යම් තැනකින් උපුටා ගන්නා තොරතුරු වේ නම් එම උපුටාගත් මූලාශ්‍රය නිවැරදිව දැක්විය යුතුය.
සදාචාරයට හානි වන තොරතුරු ලබා ගැනීමෙන් වැළකිය යුතුය.
සෑම පුද්ගලයෙකුගේ ම කීර්ති නාමයට ගරු කරමින් අනවශ්‍ය පෙළඹවීම්වලින් තොරව තොරතුරු ලබාගත යුතු ය.
කෙනෙකුගේ පුද්ගල ජීවිතයට හානි වන තොරතුරු රැස් කිරීමෙන් වැළකිය යුතුය.
ජාති භේද, ආගම් භේද ඉස්මතු කර වන තොරතුරු ලබා ගැනීමෙන් වැළකිය යුතුයි.
පෞද්ගලික වාසි අපේක්ෂාවෙන් තොරතුරු රැස් නොකළ යුතුය.

(iv)




නිර්මාණාත්මක රචනයේ දී උඩුකුරු පිරමීඩ ආකෘතිය මගපෙන්වයි.